www.wsws.org

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුදවාදයට හා සමාජ ප්‍රතිගාමීත්වයට එරෙහිව යුරෝපා කම්කරුවන් හා තරුනයින් එක්සත් කරනු

## Unite European workers and youth against militarism and social reaction

***සමාජවාදී සමානතා පක්ෂයේ හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ප්‍රකාශය***
**2005 මාර්තු 18**

*ඉරාක ආක්‍රමනයෙහි දෙවැනි සංවත්සරය සලකුනු කිරීම සඳහා මාර්තු 19 දා යුරෝපය පුරාම පැවැත්වීමට නියමිත පෙලපාලිවල දී පහත පල වන පත්‍රිකාව බෙදාහරිනු ඇත.*

මාර්තු 19 දා, යුරෝපා සංගමයෙහි අගනුවර වන බ්‍රසල්ස් හා අනෙකුත් බොහෝ යුරෝපා නගරවල, යුද්ධයට හා සමාජ ප්‍රතිගාමීත්වයට එරෙහිව, පෙලපාලි පැවැත්වේ. යුරෝපා ආන්ඩුවලට අනුගත වන මෙම පෙලපාලි නිල වසයෙන් සංවිධානය කරන්නන්ට හාත්පසින් ම වෙනස් වන ආකාරයකින්, යුදවාදයට හා ජීවන තත්වයන්ට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිව එල්ල කෙරෙන ප්‍රහාරවලට විරෝධය පානු වස්, ස්වාධීන සමාජවාදී වැඩ පිලිවෙලක පදනම මත එක්සත් වන ලෙස යුරෝපා මහාද්වීපයෙහි මුලු මහත් කම්කරු ජනතාවගෙන් අපි ඉල්ලා සිටිමු.

ඉරාක යුද්ධයෙහි දෙවැනි සංවත්සරය යෙදී ඇත්තේ මාර්තු 19 දින ය. මෙම යුද්ධය ඓතිහාසික හැරුම් ලක්ෂයක් සලකුනු කරයි. මුසාවන් මත පදනම් වෙමින් හා ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කරමින්, බොහෝ සෙයින්ම අනාරක්ෂිත වූ රටකට එරෙහිව එක්සත් ජනපදය ප්‍රහාර එල්ල කලේ ය. මෙතෙක් මෙම යුද්ධය හේතු කොටගෙන යටත් පිරිසෙයින් ඉරාක ජාතිකයන් එක් ලක්ෂයක් ද ඇමරිකානු සොල්දාදුවන් 1500ක් ද මරනයට පත්ව ඇති අතර තවත් ඇමරිකානු සොල්දාදුවන් 10,000ක් තුවාලකරුවන් බවට පත්ව ඇත. දෙලක්ෂ පනස්දාහක ජනගහනයක් සහිත ෆලූජා නගරය පොලවට සමතලා කෙරිනි. එක්සත් ජනපදය මගින් පාලනය වන රැඳවුම් කඳවුරුවල ඉරාක ජාතිකයින් 9000ක් පමන සිරගත කොට ඇත. ආක්‍රමනශීලි යුද්ධය හා ඉරාකය අල්ලා ගැනීම, යුද අපරාධ වූ අතර තව දුරටත් එලෙස ම පවතී.

ජාත්‍යන්තර නීතිය නොතකා මිලිටරි බලය යෙදීම මගින් තම අවශ්‍යතාවන් බලහත්කාරයෙන් ඉටු කර ගැනීමට තව දුරටත් කටයුතු කරන බවට බුෂ් පාලක තන්ත්‍රය පැහැදිලි කොට ඇත. ලතින් ඇමරිකාවෙහි මිලිටරි තන්ත්‍රයන්ට හා ඝාතක කන්ඩායම්වලට සහායවීම මගින් - විශේෂයෙන්, නිකරගුවාවට එරෙහි කොන්ට්‍රා යුද්ධය මගින් - සිය උත්තේජනය ලබාගත් ජොන් නෙග්‍රොපොන්ටේ, එලියට් ඒබ්‍රම්ස් හා ජොන් බොල්ටන් වැනි පුද්ගලයින්, බුෂ් ජනාධිපති මැතිවරනයෙන් යලි ජයගැනීමෙන් අනතුරුව, ඉහලම පෙලේ දේශපාලන තනතුරුවලට පත්ව සිටිති. එක්සත් ජනපද විදේශ ප්‍රතිපත්තිය දැන් සිරියාව හා ඉරාකය ඉලක්ක කොට ගෙන ඇත.

ඇතැම් යුරෝපා ආන්ඩු, විශේෂයෙන් ම ජර්මනිය හා ප්‍රන්සය, ඉරාක යුද්ධය ප්‍රතික්ෂේප කිරීම, ඒවායේ දෙපිටකාට්ටුකම මුලුමනින් ම අනාවරනය කර ඇත. ඉන් පසුව එක්සත් ජනපදය ප්‍රමුඛත්වය දරූ ඉරාකය අල්ලා ගැනීමට ඔවුන් සිය අනුමැතිය ලබා දී ඇත. ඉරාක ආරක්ෂක බලකායන් පුහුනු කිරීමෙහි හා ඇෆ්ගනිස්තානයෙහි එක්සත් ජනපද බලකායන්ට සහන සලසනු වස් තම බලකායන් පිටත්කර යැවීමෙහි ලා ඔවුන්ගේ සක්‍රීය සහාය ලබා දී ඇත.

ආරම්භයේ සිට ම, මේ ආන්ඩු, පීඩිත රටක් යටපත් කිරීමට විරුද්ධ වූයේ නැත. නමුත්, ඒ වෙනුවට මේ ආන්ඩු අභිප්‍රේරනය වූයේ තමන්ගේ ම අධිරාජ්‍යවාදී ඕනෑඑපාකම් පිලිබඳ බියක් මගිනි. සාරවත් ඛනිජ තෙල් සැපයුම් සහිත ගල්ෆ් කලාපය තම සෘජු පාලනය යටතට ගැනීමේ එක්සත් ජනපද වෑයම, යුරෝපා බල ශක්ති සැපයුම් හා ලාභදායී වෙලඳපොලවලට තර්ජනයක් එල්ල කරයි.

එක්සත් ජනපද අධිරාජ්‍යවාදයෙහි සීඝ්‍ර වර්ධනයට යුරෝපා මහා බලවතුන් ප්‍රතිචාරය දැක් වූයේ තමන්ගේ ම යලි ආයුධ සන්නද්ධ වීමේ වැඩ පිලිවෙල් ඇරඹීම හා තමන්ගේ ම ආරක්ෂක මූලෝපායන් වර්ධනය කිරීම තුලිනි. මෙයට බුෂ් පාලන තන්ත්‍රය විසින් යොදාගන්නා ලද ''පූර්ව භංග යුද්ධය'' පිලිබඳ ප්‍රතිපත්තිය ද, ඇතුලු විය. ලොව වටා මැදිහත්වීමට හැකියාව ඇති යුරෝපා මිලිටරි බලකායන් ඔවුන් ස්ථාපිත කර ඇත. එසේ ස්ථාපිත කර ඇත්තේ උතුරු අත්ලාන්තික ගිවිසුම් සංවිධානයෙන් හෙවත් නේටෝවෙන් හා යුරෝපා ආයුධ ඒජන්සියෙන් ස්වාධීනව ය. එහි අරමුන වන්නේ

ඇමරිකානු ආයුධ තාක්ෂනයෙන් යුරෝපා මහාද්වීපය ස්වාධීන කිරීම ය.

ඇමරිකානු හා යුරෝපා අධිරාජ්‍යවාදයන් දෙකෙහි ම අරමුන වනුයේ ඉරාක යුද්ධයෙන් ඇරඹි, ලොව යලි නව යටත්විජිත බෙදීම තව දුරටත් ඉදිරියට ගෙන යාමට ය. මෙහි දී ලොවෙහි අමුද්‍රව්‍ය, වෙලඳපොලවල් හා ලාභ ශ්‍රමයෙහි මූලාශ්‍රයන්වලින් සිංහභාගය තමන් වෙත ග්‍රහනය කර ගැනීමට ය ඔවුන් තරග වදින්නේ. මෙම ක්‍රියාවලියෙහි තර්කනය මිලිටරි ගැටුම් තව දුරටත් වැඩි කිරීමට මග පාදයි. සිරියාවට හා ඉරානයට එරෙහිව, උතුරු කොරියාවට, චීනයට හා ඇතැම්විට රුසියාවට එරෙහිව සහ අවසානයේ දී ඒවා මහා බලවතුන් අතර ගැටුම් බවට පත්වනු ඇත. පසුගිය සියවසෙහි මුල් භාගයෙහි දී සිදු වූවාක් මෙන්, ලොව බෙදීම හා යලි බෙදීම සඳහා අරගලය ලෝක යුද්ධයක අනතුරක් මතු කරයි.

යුදවාදයෙහි වර්ධනය ප්‍රජාතාන්ත්‍රීය හා සමාජ අයිතීන්ගේ විනාශය කැටුව එයි. බුෂ්ගේ ''ත්‍රස්තයට එරෙහි යුද්ධයෙහි'' එකිනෙකට සම්බන්ධ පැති දෙකක් ඇත. ජාත්‍යන්තර වසයෙන් ඉන් ගම්‍ය වන්නේ මිලිටරි බලය අසීමිත ලෙස යෙදවීමයි. රට තුල ප්‍රාථමික ප්‍රජාතන්ත්‍රීය අයිතිය විනාශ කිරීම, පොලිස් රාජ්‍ය සංවිධානයක් නිර්මානය කිරීම, පොහොසතුන්ට වාසිවන පරිදි ජාතික ධනය තවදුරටත් යලි බෙදාහැරීම ඊට ඇතුලත් වෙයි.

යුරෝපය ද එම මාවතේ ම ගමන් කරමින් සිටී. යුරෝපා සංගමයේ ව්‍යාප්තිකරනය යටතේ ආර්ථික ඒකාග්‍රකරනයෙහි ඉලක්කය වනුයේ යුරෝපා කම්කරු පන්තියෙහි ජීවන තත්වයන් හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් විනාශ කිරීම තුලින් සිය ජාත්‍යන්තර ප්‍රතිමල්ලවයන්ට එරෙහිව ලෝක කරලියෙහි යුරෝපයේ ප්‍රධාන බලවතුන් හා පාරජාතික සංගත තරගකාරී කිරීම ය.

නව යුරෝපා ව්‍යවස්ථාව යුරෝපා පුරවැසියන්ගේ අයිතීන් සහතික නො කරයි. එය සහතික කරන්නේ කම්කරු ජනතාවට අවාසි වන පරිදි මහා ව්‍යාපාරිකයන්ගේ සහ පාලක ප්‍රභූස්තරයන්ගේ අයිතීන් ය. කම්කරුවන්ගේ නිදහස් සංචලනයට එය දැඩි සීමාවන් පනවන අතර ''සේවා, භාන්ඩ හා ප්‍රාග්ධන'' නිදහස් සංචලනයට එය ඉඩ සලසයි.

සරනාගතයන්ට හා සංක්‍රමනිකයින්ට සලකන දුෂ්ඨතම ආකාරය තුල එය එහි ප්‍රකාශනය අත්කර ගනී. යුරෝපය මුද්‍රා තබන ලද බලකොටුවකට පරිවර්තනය වීමේ හේතුවෙන් යුරෝපා දේශසීමාවන්හි සෑම වර්ගයක් පාසාම දහස් සංඛ්‍යාත ජනයා මිය යති. ''ස්වාධීනත්වය, අරක්ෂාව හා සාධාරනත්වය'' පිලිබඳ සංකල්ප ''අසීමිත හා විකෘති කරනු නොලැබ ඇති තනි වෙලඳ පොලක්'' ආරක්ෂා කිරීමේ ප්‍රතිභාවකට ව්‍යවස්ථාව තුල සම්බන්ධ වී ඇත. එක්සත් ජනපදය හා උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයෙන් හෙවත් නේටෝවෙන් ස්වාධීන වූ ද සිය ආඥා ව්‍යූහයෙන් හා විදේශ ඇමතිගෙන් සමන්විත වූ ද බලවේගයක් ලෙස යුරෝපය ස්ථාපිත කිරීම සඳහා පොදු මිලිටරි ප්‍රතිපත්තියක් සැකසීම ව්‍යවස්ථාව තවදුරටත් අපේක්ෂා කරයි.

## අවශ්‍ය වන්නේ කිනම් ඉදිරි දර්ශනයක් ද?

මේ ක්‍රියාමාර්ගය යුරෝපා කම්කරු ජනතාවගේ පුලුල් ප්‍රතිරෝධනයට ලක්ව ඇත. යන්තමින් මීට වසර දෙකකට පෙර, ඉරාක යුද්ධයට විරෝධය පානු වස් දස ලක්ෂ සංඛ්‍යාත ජනකායක් වීදි බැස ගත්හ. යුද්ධයට සහාය දැක්වූ බර්ලුස්කෝනිගේ හා බ්ලෙයාර්ගේ ආන්ඩු පැවති ඉතාලියෙහි හා බ්‍රිතාන්‍යයෙහි මේ පෙලපාලි සුවිශේෂ ව විශාල විය. ඉනික්බිතිව, අනුකම්පා විරහිත සුභසාධන කප්පාදුවලට එරෙහිව ප්‍රන්සය, ජර්මනිය, ඉතාලිය හා වෙනත් නොයෙකුත් රටවල් පොදුජන විරෝධතා මාලාවකින් හෙල්ලුම්කා ඇත.

එසේ වුව ද, මෙම විරෝධතාවල අඩුවක් ලෙස පවතින්නේ පුලුල් ලෙස පැතිර ඇති ප්‍රතිරෝධය ඒකරාශි කර යුද්ධයෙහි හා ප්‍රතිගාමීත්වයෙහි මූලයට එරෙහිව අරගලය වෙත යොමු කල හැකි වලංගු ඉදිරි දර්ශනයකි - එනම්, ධනේශ්වර ලාභ පද්ධතිය හා එය පදනම් වූ ජාතික රාජ්‍ය පද්ධතියට එරෙහිව.

යුද්ධයට හා සමාජ ප්‍රතිගාමීත්වයට එරෙහිව සටන් කිරීමට නම් ඒවායෙහි හේතු අවබෝධ කරගත යුතු ය. එනම්, ධනේශ්වර පද්ධතියෙහි අර්බුදය යි. යුද්ධය හා සමාජ ප්‍රතිගාමීත්වයට එරෙහිව කෙරෙන සටන සඳහා සමාජවාදී ඉදිරි දර්ශනයක් අවශ්‍ය වේ. ලාභ ඉපයීමේ ආයාසයට ඉහලින් මානව අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දෙන සමාජවාදී සමාජයක් සඳහා කම්කරු පන්තිය එක්සත්ව සටන් වැදිය යුතු ය.

බුෂ් පාලක තන්ත්‍රය හා එහි දක්ෂිනාංශික ප්‍රතිපත්තිය ඇමරිකානු ධනවාදයේ ගැඹුරු අර්බුදයෙහි ප්‍රකාශනයකි. පලමුවැනිව, මෙය ලෝක ආර්ථික තත්වය තුල එක්සත් ජනපදය දිග්ගැසුනු පිරිහීමකට ලක්වීමෙන් සමන් විත වෙයි. එය ඇමරිකාවේ අති විශාල නයගැති කමින් හා ඩොලරයට ප්‍රතිමල්ලව වලංගු මුදලක් ලෙස යුරෝව ඉස්මතු වීමෙන් පිලිබිඹුවෙයි. සිය මිලිටරි ආධිපත්‍යය ප්‍රයෝජනයට ගනිමින් මේ ආර්ථික පිරිහීම ව්‍යවර්ථ කිරීම සඳහා ඇමරිකානු පාලක ප්‍රභූවෙහි වෑයම ඇෆ්ගනිස්ථානයෙහි හා ඉරාකයෙහි යුද්ධ අන්තර්ගත කරගති. එක්සත් ජනපදය තුල සමාජ අසමානතාවය පිරිහෙන සුලු අන්දමට වර්ධනයවීම මෙයට සම්බන්ධිත ය. පොදු ජනතාව වැඩි වන අනාරක්ෂිත හා අවදානම් සහිත ජීවිත ගත කරන අතර ඇමරිකානු සමාජයේ ඉහලම ස්තරය තුල ධනය එක්තැන්වීම ප්‍රජාතන්ත්‍රීය ආයතන හා එකිනෙක නො ගැලපෙයි.

එක්සත් ජනපදයෙහි අර්බුදය යුරෝපයට සෘජු ඵලවිපාක ගෙන දෙයි. පශ්චාත් යුද සමයෙහි පැවති සමාජ සමථය ඇමරිකානු ධනවාදයෙහි අධිපතිත්වයට සමීපව බැඳී තිබුනි. සෝවියට් සංගමයට එරෙහිව සීතල යුද ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන්ට අනුව එක්සත් ජනපදය සිය බටහිර යුරෝපීය ප්‍රතිමල්ලවයන් යලි ගොඩනැංවී ය. යුරෝපීය ප්‍රාග්ධනය ස්ථාවර කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම තවදුරටත් අවශ්‍ය නැතැයි සෝවියට් සංගමයෙහි කඩාවැටීම තුලින් එක්සත් ජනපද පාලක ප්‍රභූවට එත්තුගැන්වී ඇත. එක්සත් ජනපද ප්‍රතිපත්තියෙහි විස්ථාපනය පිපිරෙන සුලු ආර්ථික, දේශපාලනමය හා මිලිටරිමය ආතතීන් දියත් කර ඇත. වඩ වඩාත් ආක්‍රමනශීලීව සිය භූගෝලීය අවශ්‍යතා පසුපස හඹායෑමෙන් හා ''ඇමරිකානු'' සමාජ තත්වයන් තම රටවලට හඳුන්වා දීමෙන් යුරෝපා අධිරාජ්‍යවාදය මෙයට ප්‍රතික්‍රියා දක්වා ඇත.

මේ ක්‍රියාමාර්ගයට ඩෙමොක්‍රටික් පක්ෂයෙහි මෙන්ම කොන්සර්වර්ටිව් පක්ෂයෙහි ද සහාය එක සේ ලැබේ. ජර්මනියෙහි සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ග්‍රීන් පක්ෂ ආන්ඩුවෙහි හා ප්‍රන්සයෙහි කොන්සර්වර්ටිව් පක්ෂ ආන්ඩුවෙහි හා බ්‍රිතාන්‍යයෙහි ලේබර් පක්ෂ ආන්ඩුවෙහි ප්‍රතිපත්ති අතර ඇත්තේ සුලු වෙනස්කම් පමනි. ඉරාක යුද්ධය සම්බන්ධයෙන් තම තමන්ගේ වෙනස්කම් පසෙක තිබිය දී, යුරෝපා සන්නද්ධ බලකායන් ගොඩනැගීමෙහි ලා ජර්මනිය, ප්‍රන්සය හා බ්‍රිතාන්‍ය සමීප සහයෝගයෙන් කටයුතු කරමින් සිටී. වර්ධනය වන යුදවාදය හා සමාජ ප්‍රතිගාමීත්වය හුදෙක්ම විශේෂ ප්‍රතිපත්තියක ප්‍රතිඵලයක් නොව, ධනේශ්වර පද්ධතියෙහි ගැඹුරු වූ අර්බුදයක නිමැවුමක් බව මේ තුලින් ම පැහැදිලි වේ.

## සමාජ ප්‍රජාතන්ත්‍රවාදය හා වෘත්තීය සමිති

යුද්ධයට හා යුරෝපා සංගමයේ ආර්ථික ප්‍රතිපත්තිවලට එරෙහි බ්‍රසල්ස් හි පෙලපාලිය කැඳවන ලද්දේ පුලුල් සන්ධානයක් මගිනි. එම සන්ධානයට වෘත්තීය සමිතිවල සිට ඇටැක් සංවිධාන හා ආනේකවිධ සාම ව්‍යපාර ඇතුලු විය.

මේ සංවිධාන සියල්ලටම පාහේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සමග කිනම් ආකාරයේ හෝ සබඳකම් ඇත. අයිජී මෙටල් හා වර්ඩි වැනි ජර්මානු වෘත්තිය සමිති. සුභ සාධන සැපයුම් මත දැවැන්ත ප්‍රහාර එල්ල කිරීම සඳහාත් වැටුප් කපාහැරීම් පැනවීම සඳහාත් ජර්මානු ආන්ඩුව සමග සමීප සහයෝගයෙන් කටයුතු කර ඇත. ඇටැක් ඉස්මතු වූයේ ප්‍රන්ස සමාජවාදී පක්ෂයෙහි ස්තරයක් තුලිනි. ඒ එම පක්ෂය ආන්ඩු බලය ඉසුලූ කලක ය. තවද, පෙලපාලියක් පවත්වන ලෙස මුලින්ම ඉල්ලා සිටි යුරෝපා සමාජ සංසදය ලේබර් පක්ෂයෙහි නායකත්වයෙන් යුතු මහා ලන්ඩන් සභාවේ ද සහාය ඇතිව ලන්ඩනයෙහි දී පසුගිය ඔක්තෝබරයෙහි දී හමුවිය.

මේ සංවිධානවල කේන්ද්‍රීය ප්‍රවාදය වනුයේ පවත්නා ''නව ලිබරල්'' ආර්ථික ප්‍රතිපත්තිවලට ප්‍රතිවිරුද්ධව ධනේශ්වර යුරෝපා සංගමයෙහි සන්දර්භය තුල සමාජමය හැඩගැස්මක් ඇති ආර්ථික ප්‍රතිපත්තියක් ඉදිරිපත් කල හැකි බව ය. තවද, එක්සත් ජනපදය මෙන් නොව, යුරෝපා ධනේශ්වර ආන්ඩුවලට සාමයේ ප්‍රතිපත්ති අනුගමනය කිරීමට බල කර හැකි බව ය. ඔවුන්ගේ අරමුන වන්නේ සිය ප්‍රතිපත්ති වෙනස් කිරීමට පොලඹවා ගැනීමට යුරෝපා ප්‍රභූ ස්තරයන්ට පීඩනයක් එල්ල කිරීම ය. සමාජවාදී ඉදිරි දර්ශනයක් හා ස්වාධීන සමාජවාදී ව්‍යාපාරයක් ගොඩ නැගීම ඔවුහු ප්‍රතික්ෂේප කරති.

මෙම ඉදිරි දර්ශනය තුලින් ඉදිරියට යාමක් නැත. සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ සහ වෘත්තීය සමිතිවල පාවාදීම්වලත් අත්‍යවශ්‍ය නිගමන ඇතිකර ගැනීමෙන් හා සමාජ ප්‍රතිසංස්කරනවාදයේ සඵලත්වය පිලිබඳ එහි මිථ්‍යාවන් ජය ගැනීමෙන් ද එය කම්කරු පන්තිය වලකාලයි.

වසර හතක් වැනි කෙටි කලකට පෙරාතුව සියලු යුරෝපීය රටවලම පාහේ නායකත්වය දරන ලද්දේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩු විසිනි. ජර්මනියෙහි හා එංගලන්තයෙහි සමාජ ප්‍රජාතන්ත්‍ර ආන්ඩු තව මත් බලයේ සිටිති. සෑම රටක ම, මහ ව්‍යාපාරිකයන්ගේ අවශ්‍යතාවන් අනුව ඔවුන් ආර්ථික ප්‍රතිපත්ති පනවා ඇත. ඔවුන්ගේ දකුනට බරවීම ආපසු හැරවිය නොහැක්කකි.

භූගෝලීය ධනවාදයේ සන්දර්භය තුල ''නව-ලිබරල්වාදයට'' විකල්පයක් නොමැත. ධනේශ්වර ජාතික රාජ්‍යයෙහි රාමුව තුල ප්‍රතිසංස්කරනවාදී ප්‍රතිපත්තීන්හි පදනමට නිෂ්පාදනයෙහි භූගෝලීයකරනය විසින් යටි වල කපා ඇත. නූතන ආර්ථික දිවියෙහි ආධිපත්‍යය උසුලන පාරජාතික සමාගම්වලට වැටුප් හා බදු අයකිරීම් අඩු රටවලට නිෂ්පාදන හා සේවා කර්මාන්ත ගෙන යා හැකි ය. මේ වර්ධනය ඉදිරියෙහි වෘත්තීය සමිති හා සමාජප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ කිසිවක් කර කියා ගත නොහැකි තත්වයට පත්ව සිටී. ජාතික රාජ්‍යයෙහි ආරක්ෂකයින් වසයෙන්, ජාතික ප්‍රාග්ධනයෙහි අවශ්‍යතාවන්ට අනුකූලව කම්කරු පන්තියෙහි වැටුප් හා ජීවන තත්වයන් පහත හෙලීමේ කටයුත්තට සහභාගි වීමට ඔවුන්ට අනිවාර්යයෙන් ම සිදු වේ.

## ලෝක සමාජවාදී වෙබ් අඩවිය හා හතර වැනි ජාත්‍යන්තරය

ජාතික ප්‍රතිසංස්කරනවාදී දිශානතියක පදනම මත හෝ ජාතික ස්වෛරීභාවය රැක ගැනීම සඳහා කරන ඉල්ලීම්වල පදනම මත යුරෝපා සංගමයෙහි ධනේශ්වර

න්‍යාය පත්‍රයට විරුද්ධත්වය දැක්විය නොහැක. එවැනි ජාතිකවාදී ඉදිරිදර්ශනයක් ඉවහල් වන්නේ කම්කරු පන්තිය බෙදීමට හා මහා ව්‍යාපාරිකයන්ගේ ප්‍රහාරවලට පහසුකම් සැලසීමට  පමනි.

ඉතාමත් ප්‍රාථමික අයිතීන් හා අතීත සමාජ ජයග්‍රහන ආරක්ෂා කර ගැනීම සඳහා අති මූලික වසයෙන් වෙනස් වූ මූලෝපායක් අවශ්‍ය වේ. එහි කේන්ද්‍රයෙහි තිබිය යුත්තේ සමාජවාදී වැඩ පිලිවෙලක් මත පදනම් වූ කම්කරු පන්තියෙහි ජාත්‍යන්තර එකමුතුව ය. කම්කරු පන්තියෙහි ප්‍රජාතන්ත්‍රීය පාලනය යටතේ මුලු මහාද්වීපයෙහි ම නිෂ්පාදන බලවේගවලට වර්ධනයට මග පෑදිය හැක්කේ යුරෝපා එක්සත් සමාජවාදී ජනපදයක් පිහිටුවීමෙන් පමනි.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ සමාජ ප්‍රතිසංස්කරන වැඩ පිලිවෙලෙහි පදනම ඉවත් කල ආර්ථික හා සමාජ වෙනස්කම් ම ය, සමාජ විප්ලවයේ මාක්ස්වාදී වැඩපිලිවෙල සාක්ෂාත් කර ගැනීමට වාස්තවික තත්වයන් නිර්මානය කරන්නේ.

භූගෝලීයකරනය, ජාත්‍යන්තර කම්කරු පන්ති ශ්‍රේනිය අති විශාල ලෙස පුලුල් කොට ඇත. සියලු ධනේශ්වර සමාජ තුල දුප්පත් පොහොසත් දෙපිල අතර ධ්‍රැවාන්තගතවීම, වර්ධනය වන යුදවාදය හා යුද්ධය හා මහා බලවතුන් අතර වර්ධනය වෙමින් පවතින ගැටුම් යන කරුනු සමාජ විරෝධතා බිඳුම් ඉමට ගෙන ගොස් ඇත. දස ලක්ෂ සංඛ්‍යාත ජනකායක් සාම්ප්‍රදායික පක්ෂවලින් විගලිත වී දේශපාලන විකල්පයක් සොයමින් සිටී.

හතර වැනි ජාත්‍යන්තරයෙහි ජාත්‍යන්තර කමිටුව හා ලොව වටා එයට අඩංගු සමාජවාදී සමානතා පක්ෂ විසින් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* පලකරනු ලැබේ. කම්කරු ජනයාගේ දේශපාලන විඥානය ඉහල නැංවීම සඳහා ත් ජාත්‍යන්තර වසයෙන් කම්කරු පන්තිය එක්සත් කරන ස්වාධීන සමාජවාදී ව්‍යාපාරය නිර්මානය කිරීම සඳහා ත් එම වෙබ් අඩවිය ස්ථාපිත කර ඇත. ඉතාමත් වැදගත් දේශපාලන, සමාජීය හා සංස්කෘතික සිද්ධීන් පිලිබඳව සමාජවාදී විශ්ලේශනයක් සපයන මෙම වෙබ් අඩවිය භාෂා ගනනාවකින් පලකෙරේ.

යුද්ධයට හා සමාජ ප්‍රතිගාමීත්වයට විරුද්ධ වීමට උත්සුක වන සියල්ලන්ට ම *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කියවන ලෙසත් සමාජවාදී සමානතා පක්ෂය හා හතර වැනි ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගොඩනැගීමෙහි ලා සහභාගී වන ලෙසත් අපි ඇරයුම් කර සිටිමු.

© www.wsws.org